# ශ්‍රී ලංකා මහ බැංකුවේ විකාශනය සහ ක්‍රියාකාරීත්වය

ඩී.එම්. උදේනි චතුරිකා දෙලන[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමය පිළිබඳ විග්‍රහ කිරීමේදී වැදගත් වූ මූල්‍ය ආයතනයක් ලෙස මහ බැංකුව සැලකිය හැක. මූල්‍ය පද්ධතියේ ප්‍රධානතම ආයතනය ලෙස හඳුන්වන්නේ ද මහ බැංකුව වේ. සමස්ත ආර්ථිකයේ කටයුතු මෙහෙයවීම කෙරෙහි විශාල බලපෑමක් සිදු කරන්නට මහ බැංකුව තුළින් සිදුවන්නේ අනගි මෙහෙයකි. මෙරට බැංකු කටයුතු මූල්‍ය හා ගෙවීම් පද්ධතිය සුරක්ෂිත කිරීමේ වගකීම පැවරී ඇත්තේ මහ බැංකුව වෙතට ය. ලොව රටවල් ගත් කළ සෑම රාජ්‍යයකටම මහ බැංකුවක් දක්නට ලැබෙන අතර එය රටක සෛවරීභාව සංකේතයක් ලෙස සලකනු ලැබේ. වසර ගණනකට පෙර ශ්‍රී ලංකාවේ බිහිවූ මහ බැංකුව එකල ඇති වූ සරල මූල්‍ය අවශ්‍යතාවන් ඉටු කරගැනීම උදෙසා ක්‍රියාත්මක වුව ද නූතනය වන විට එමගින් සිදුවන කාර්යභාරය ඉතාම ඉහළ මට්ටමක පවතී. ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක් වෙතම සෘජු මැදිහත්වීමක් සිදු කරමින් ආර්ථිකය වඩාත් ශක්තිමත්ව පවත්වාගෙන යෑම උදෙසා මහ බැංකුව තුළින් ඉටු වන්නේ විශාල කාර්යභාරයකි. මෙසේ සමස්ත ආර්ථිකයේ රඳාපැවැත්ම වෙත විශාල පිටුබලයක් වන්නා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විකාශනය පිළිබඳවත් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳවත් විස්තරයක් මෙම ලිපිය හරහා පැහැදිලි කෙරේ.

**මුඛ්‍ය පද :-** මූල්‍ය ආයතන, මූල්‍ය පද්ධතිය, මහබැංකුව

**හැඳින්වීම.**

ලෝකයේ සියලුම රාජ්‍යයන් තුළ එක් ප්‍රධාන වූ මූල්‍ය ආයතනයක් දැකිය හැක. එය මධ්‍යම බැංකුව නමින් හඳුන්වයි. විවිධ රටවල මෙය විවිධ නම් වලින් හඳුන්වනු ලැබේ. කුමක නමින් හැඳින්වුව ද මහ බැංකුව තුළින් රටක ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඉටු කරයි. බොහෝ රටවල ආර්ථික ශක්තිමත්භාවය කෙරෙහි එවැනි රටවල පවතින මධ්‍යම බැංකුවේ දායකත්වය මහඟු ලෙස බලපාන බව වැදගත් කරුණකි.

1688 ස්වීඩනයේ ස්විස් බැංකුවෙන් ආරම්භ වූ මහ බැංකු ක්‍රමය, ලොව සෑම රටකම පාහේ නූතනයේ ස්ථාපිත වී ඇත. රටක ආර්ථික අරමුණු කරා යොමු කරමින් එහි කටයුතු සිදුවේ.19 වන සියවසේ අගභාග වන විට ලාංකික ආර්ථික ක්‍රමය පදනම්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ )ආර්ථික විද්‍යා දෙවන වසර, udenidelana@gmail.com

වූයේ ප්‍රධාන වශයෙන් වාණිජ හා වැවිලි කර්මාන්තය මතය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට වැවිලිකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් වාණිජ බැංකු ක්‍රමයක් ආරම්භ වුව ද එය ග්‍රාමීය අංශය වෙතට ප්‍රමාණවත් සේවාවක් නොසපයන ලදි. මෙරට නිදහස ලබන අවධිය වන විට ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පාලනය කරන ලද්දේ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය මගිනි. නමුත් ඒ තුළින් ලංකාවේ ආර්ථික අවශ්‍යතාවන්ට සරිලන ආකාරයේ සේවාවක් ලබාදීමට අපොහොසත් විය. මේ හේතුවෙන් මෙරට මහ බැංකුවක් පිහිටුවීමේ අවශ්‍යතාව තදින්ම දැනෙන්නට විය. ඒ අනුව සිදු වූ ක්‍රියාකලාපයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 1950 අගෝස්තු 28 දින ශ්‍රී ලංකාව තුළ මහ බැංකුව ස්ථාපිත විය. එතැන් පටන් රාජ්‍ය තුළ පවතින ආර්ථික අරමුණු සඵල කරගැනීම උදෙසා විශාල දායකත්වයක් මහ බැංකුව විසින් සිදු කරන ලැබේ.

ඒ අනුව කලින් කලට පවතින ආර්ථික තත්වය මත ශ්‍රී ලංකා මහ බැංකුව එහි කාර්යයන්, අරමුණ, සංවිධාන ව්‍යුහය වෙනස් කරමින් මහ ජනතාව හා රජය වෙත ඉතා කාර්යක්‍ෂම බැංකු සේවාවක් සැපයීමට බැඳී සිටියි. මෙසේ අපරිමිත දායකත්වයක් ලබාදෙන ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ විග්‍රහ කිරීම මෙම ලිපියේ අරමුණ වේ

**ආරම්භය හා විකාශය**

ලෝකයේ සියලුම රාජ්‍යයන් තුළ එක් ප්‍රධාන වූ මූල්‍ය ආයතනයක් දැකිය හැක. එය "මධ්‍යම බැංකුව" නමින් හඳුන්වයි. විවිධ රටවල මෙය විවිධ නම්වලින් හඳුන්වනු ලැබේ. කුමන නමින් හැඳින්වුව ද මහ බැංකු තුළින් රටක ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඉටු කරයි. බොහෝ රටවල ආර්ථික ශක්තිමත්භාවය කෙරෙහි එවැනි රටවල පවතින මධ්‍යම බැංකුවේ දායකත්වය මහගු ලෙස බලපාන බව වැදගත් කරුණකි.

1688 ස්වීඩනයේ ස්විස් බැංකුවෙන් ආරම්භ වූ මහ බැංකු ක්‍රමය, ලොව සෑම රටකම පාහේ නූතනයේ ස්ථාපිත වී ඇත. රටක ආර්ථික අරමුණු කරා යොමු කරමින් එහි කටයුතු සිදු වේ.

19 වන සියවස අගභාගය වන විට ශ්‍රී ලාංකික ආර්ථිකය තුළ වාණිජ හා වැවිලි අංශය කැපී පෙනෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැවිලිකාර පිරිසක් බිහි වී සිටි අතර ඔවුන් මූල්‍ය ක්‍රමය තුළ නිරතුරුව ගණුදෙනු සිදු කරමින් සිටි පිරිසක් විය. ඒ අවධිය වන විට වාණිජ බැංකු ක්‍රමය ස්ථාපිත වී පැවතිය ද ඉන් මෙරට ග්‍රාමීය අංශය සඳහා ප්‍රමාණවත් සේවයක් ඉටු නොවුණි. එකල වාණිජ බැංකු වැවිලිකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් පමණක් සේවය කරන්නට විය. ඊට අමතරව ආර්ථික ක්‍රමය තුළ මූල්‍ය සමාගම් ස්වල්පයක් ද ඉතිරි කිරීමේ ආයතන හා රක්‍ෂණ ආයතන ද ස්ථාපිත වී පැවතිය ද මේවා මගින් ප්‍රමාණවත් සේවාවක් ලබාදීමට නොහැකි වී තිබුණි. මෙරට නිදහස ලබන අවධිය වන විට ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පාලනය කරන ලද්දේ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයක් මගිනි. මේ අවධියේ යටත් විජිත වශයෙන් පැවති රටවල් රාශියක්ම මෙම ක්‍රමය ක්‍රියාත්මක කළේ ය. 1884 ව්‍යවහාර මුදල් පනත මගින් මෙරට ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය ආරම්භ කරන ලදි. එහි පාලනය බ්‍රිතාන්‍ය කොමසාරිස් මණ්ඩලයකින් සමන්විත විය.

ව්‍යවහාර මුදල් මණ්ඩල වෙත පැවති බලතල අනුව මූල්‍ය ක්‍රමයට සිදුකල හැකි වූයේ සීමිත කාර්යයක් පමණි. ව්‍යවහාර මුදල් ක්‍රමයේ මූලික කාර්යය වූයේ රටේ මුදල් නිකුතු පාලනය කිරීමයි. ඒ අනුව ගෙවුම් තුලනය පදනම් කර ගනිමින් මුදල් නිකුත් කිරීම සිදු කරන ලදි. කෙසේ වෙතත් මෙමගින් දේශීය අවශ්‍යතාවන්ට අනුකූල ලෙස මුදල් නිකුත් කිරීමක් සිදු නොවූ බව පැහැදිලි වූ ප්‍රබල කරුණ කි. තව ද රටේ ආර්ථික අවශ්‍යතාවන්ට යෝග්‍ය මට්ටමේ ද්‍රවශීලතාවක් ඇති කිරීමට මෙම මුදල් නිකුත් කිරීමේ ක්‍රමය අපොහොසත් විය. ඒ අනුව ආර්ථික සංවර්ධනයට යෝග්‍ය පරිදි මුදල් නිකුතුවක් සිදු කිරීමට ඔවුන්ට ශක්තියක් නොතිබුණි.

මෙසේ දිනෙන් දින වර්ධනය වන ආර්ථික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් මෙරට මහ බැංකුවක් පිහිටුවීමේ අවශ්‍යතාව තදින් දැනෙන්නට විය. ඒ අනුව එවක රජය විසින් මුලතිව් රාජ්‍යසභා නියෝජිත ජේ. ත්‍යාගරාජා මහතා විසින් මහ බැංකුව පිහිටුවීමේ යෝජනාව 1945 වර්ෂයේ දී රාජ්‍ය සභාවට ඉදිරිපත් කරන ලදි. නෝට්ටු නිකුත් කිරීම, නීතිමය පාලනය, රජයේ ණය හා වාණිජ බැංකු හැසිරවීම සඳහා මහ බැංකුවක අවශ්‍යතාව ඔහු විසින් එහිදී පැහැදිලි කරන ලදි. මෙය දෙවන ලෝක සංග්‍රාමය හේතුවෙන් ක්‍රියාවට නංවාගත නොහැකි වුව ද එවකට පැවති මුදල් මණ්ඩල ක්‍රමය අහෝසි කොට ඒ වෙනුවට මූල්‍යාධිකාරයක් පිහිටුවිය යුතු බව තීරණය කරන ලදි. නිදහසින් පසු මෙරට බිහි වූ රජය විසින් මේ සඳහා උපදෙස් දීමට 1948 ඇමරිකා එක්සත් ජනපදයේ පෙඩරල් සංචිත ක්‍රමයේ ආර්ථික විද්‍යාඥයෙකු වූ ජෝන් එක්ස්ටර් මහතා ලංකාවට ගෙන්වීමට කටයුතු සම්පාදනය කරන ලදි. ඒ අනුව 1949 නොවැම්බර් 4 දින රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව 1949 නොවැම්බර් 25 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩි ඡන්දයෙන් සම්මත විය.

ඉන්පසු 1950 අගෝස්තු මස 28 දින 1949 අංක 58 දරණ මුදල් නීති පනතට අනුව මහ බැංකුව සිය කටයුතු ආරම්භ කරන ලදි. අනුව මීට පෙර පැවති ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය අහෝසි වී ඒ වෙනුවට මුදල් සැපයුම පාලනය කිරීම වෙනුවෙන් මුදල් මණ්ඩලයක් පත්කරන ලදි. මහ බැංකුව ලංකාවේ පිහිටුවීමෙන් අනතුරුව ලංකාවේ පිහිටුවීමෙන් අනතුරුව ලංකාවේ මූල්‍ය සහ බැංකු ක්‍රමය විධිමත් කිරීම හා පරිපාලනය මනාව සිදුවන්නට විය. ඒ අනුව ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමේ එකම අධිකාරිය ලෙස මහ බැංකුව දැනට වුව ද කටයුතු කරමින් සිටියි. මුදල් සැපයුම, ණය සහ පොලී අනුපාත කෙරෙහි බලපෑම් කරමින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් රජයේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කරනු ලැබේ. රජයේ බැංකුකරු හා වාණිජ බැංකුවල බැංකුකරු ලෙස ද කටයුතු කරන්නේ ද ශ්‍රී ලංකා මහ බැංකුවයි.

ශ්‍රී ලංකා රුපියලේ අගය රැකගැනීමට, ආර්ථික වර්ධනය ඇති කර ගැනීමට ජාතික මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ලැබේ. ඒ අනුව රුපියලේ විදේශීය වටිනාකමට තර්ජනයක් වූ අවස්ථාවන්හි දී ඒ සඳහා මුහුණදීමට සුදුසු උපකරණ තෝරාගැනීමට මුදල් නීති පනත මගින් මහ බැංකුවට නිදහස දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව සතුව විධිමත් සංවිධාන ව්‍යුහයක් අතීතයේ සිට පවතී. මෙහි ආරම්භක අවධියේ දී මුදල් මණ්ඩලයක් පැවති අතර එය මහ බැංකුවේ අධිපති, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා පත් කල නියෝජිතයෙකුගෙන් සමන්විත විය. මුදල් අමාත්‍යාංශයේ ලේකම් නිලබලයෙන් පත් වූ අතර සෙසු අය ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබේ.

**අරමුණු**

මහබැංකුව ආරම්භක අවස්ථාවේ දී මුදල් නීති පනතේ අරමුණු 4 ක් නියම කරන ලදී.

01. දේශීය මුදලේ අගය ස්ථායිකරණය

02. විනිමය අනුපාතය හෙවත් රුපියලේ සම අගය සහ රුපියලේ ජංගම විදේශ ගනුදෙනු සඳහා නිදහස් ව භාවිතා කිරීම ආරක්‍ෂා කිරීම.

03. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන, සේවා නියුක්තිය සහ මූර්ත ආදායම ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය

04. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සම්පත්වල පූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා දිරිදීම.

2002 වර්ෂයේ දෙසැම්බර් මස දී මුදල් නීති පනතට අනුව කරන ලද සංශෝධන හරහා මහ බැංකුවේ වත්මන් අරමුණු දෙකක් දැක්වේ.

01. ශ්‍රී ලංකාවේ මිල හා ආර්ථික ස්ථායිභාවය

02. මූල්‍ය ක්‍රමයේ ස්ථායිභාවය

මේ අනුව මහබැංකුව විසින් ආර්ථික සංවර්ධන ඉලක්ක කරමින් මෙකී අරමුණු දියත් කරන බව පැහැදිළිය.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාලනය**

ආර්ථික ක්‍රමයේ ආර්ථික ස්ථායිතාව හා මිල ස්ථායිතාව ආරක්‍ෂා වන පරිදි රටේ මුදල් සැපයුම් පාලනය කිරීමේ අරමුණින් මහ බැංකුව සැම විටම ක්‍රියා කරයි. මේ සඳහා මහ බැංකුව විසින් උපකරණ කිහිපයක් යොදා ගැනේ. එම උපකරණ ප්‍රධාන වශයෙන් මූල්‍ය පාලන ක්‍රම දෙකක් ඔස්සේ සිදු කෙරේ.

**ප්‍රමාණාත්මක මූල්‍ය පාලන ක්‍රමය**

රටේ මුළු බැංකු පද්ධතිය මගින් දෙනු ලබන ණය ප්‍රමාණය පාලනය කිරීම තුළින් සමස්ත මුදල් ප්‍රමාණය පාලනය කිරීම මෙමගින් අපේක්ෂිතය. මේ සඳහා පාලන උපක්‍රම තුනක් යොදා ගනී.

1. මහ බැංකු පොලී අනුපාතය

වාණිජ බැංකු වෙත මහ බැංකුව අවසාන ණය දෙන්නා වශයෙන් කටයුතු කරයි. එහිදී අය කරන පොලී අනුපාතය බැංකු පොලී අනුපාතය වේ. ඒ අනුව එම පොලී අනුපාතය ඉහළ පහළ දමමින් මුදල් සැපයුම සංකෝචනය හා ප්‍රසාරණය සිදු කරනු ලබයි.

2. විවට වෙළඳපොල කටයුතු

විවට වෙළඳපොල කටයුතු ලෙස හැඳින්වෙන්නේ මුදල් වෙළඳපොලේ ද්‍රවශීලතාව හා පොලී අනුපාත කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හා විකිණීම සිදු කරයි. රටේ මුදල් සැපයුම සංකෝචනය හෝ ප්‍රසාරණය කිරීම අවශ්‍ය අවස්ථාවලදී ඒවා අලෙවිකිරීම් හෝ මිලදී ගැනීම් සිදු කර රටේ මුදල් සැපයුමට බලපෑම් කරනු ලබයි.

3. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

ගණුදෙනුකරුවන් විසින් මහ බැංකුවේ තැන්පත් කරනු ලබන ගිණුම් වෙනුවෙන් මහ බැංකුව විසින් සංචිත අනුපාතිකයක් පවත්වාගෙන යා යුතු ය. මෙය " ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය" ලෙස හඳුන්වයි. මෙම අනුපාතය අඩු වැඩි කිරීමේ බලය මහ බැංකුව වෙත හිමි වේ. මේ අනුව මහ බැංකුව විසින් සංචිත අනුපාතය අඩු වැඩි කිරීම තුළින් මුදල් සැපයුම ප්‍රසාරණය හා සංකෝචනය සිදු කරයි.

**ගුණාත්මක පාලන ක්‍රම**

ආර්ථිකය තුළ අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම උදෙසා ණය සංයුතිය, ණය පරිමාව ණය ගලායන දිශාව ආදියට සෘජුව මැදිහත් වී පාලනය කිරීම ගුණාත්මක ණය පාලන ක්‍රම වේ. මූල්‍ය නීති පනතින් මෙය හඳුන්වා ඇත්තේ ''බැංකු ණය පාලනය පිළිබඳ අතිරේක රෙගුලාසි'' යනුවෙනි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ප්‍රමාණාත්මක ණය පාලන විධි අසාර්ථක හා අයෝග්‍ය වූ අවස්ථාවලදී ගුණාත්මක ණය පාලන ක්‍රම කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙහි ඇති විශේෂ ලක්ෂණය නම් මෙමගින් රටේ සමස්ත මුදල් සැපයුම කෙරෙහි බලපෑමක් ඇති නොවන අතර පවත්නා මුදල් ප්‍රමාණයට ගලායන දිශාව වෙනස් කිරීම හෝ යම් යම් අංශවලට ගලායාම වැලැක්වීම යි. (නන්ද සේන 1987)

මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ගුණාත්මක පාලන විධි කිහිපයකි.

වාණිජ බැංකුවල ණය සඳහා උපරිම කල්පිරීම් කාල නියම කිරීම වාණිජ බැංකු විසින් සිදු කරන්නා වූ ණය දීම්, අයෝජනය ආදියට සෘජුව බලපෑම් කිරීම මුදල් මණ්ඩලය මගින් සිදු කෙරේ. ඒ අනුව ණය දීම් හා ආයෝජන වැඩි කිරීම තහනම් කිරීම හෝ එසේ වැඩි කළ හැකි අනුපාත පිළිබඳ සීමාවන් නියම කිරීම සිදු කරනු ලැබේ.

සංවර්ධන ප්‍රතිපත්තිවල උද්ධමනයක් ඇති වීම ආර්ථිකයට අහිතකර ලෙස බලපා හැකි බැවින් එවැනි අහිතකර තත්ත්වයන් වැලැක්වීමට මහ බැංකුව විසින් ශීර්ෂ පිළිබඳ උපරිම සීමා නියම කිරීමේ ගුණාත්මක පාලන ක්‍රම යොදාගනි යි. උදාහරණ

ලෙස 1970 න් පසු ඇතැම් භාණ්ඩ ආනයන කිරීමට හෝ තොග රැස් කිරීම සඳහා ණය සැපයීම සීමා කරන ලෙස හෝ නතර කරන ලෙස මහ බැංකුව නියම කරන ලදි. ඒ අනුව මෝටර් රථ, රෙදි පිළි හා වෙනත් සුඛෝපභෝගී භාණ්ඩ ගෙන්වීම දැඩි ලෙස පාලනය කරන ලදි.

(අ) වාණිජ බැංකුවල ප්‍රාග්ධන සංචිත වත්කම් හා විශේෂ වත්කම් අතර අවම අනුපාතය නියම කිරීම.

වාණිජ බැංකුවල මූල්‍ය ශක්තිය ආරක්ෂා කරමින් ණය පාලනය කිරීම මින් අපේක්ෂා කෙරේ. ඒ අනුව යම් යම් ණය වර්ග සඳහා ප්‍රාග්ධන හා අතිරික්ත අනුපාත ඉහළ දමමින් අතිරික්ත අනුපාතිකයන් පහළ දමමින් ධෛර්යමත් කිරීම් ද සිදු කරනු ලැබේ.

(ආ) ණයවර ලිපි වෙනුවෙන් මුදල් ආන්තිකයක් නියම කිරීම.

භාණ්ඩ ආනයනය කිරීමේදී යොදා ගන්නා උපකණයක් ලෙස ණයවර ලිපි නම් කළ හැක. භාණ්ඩ ආනයනය සිදු කරන විට එක්වරම මුදල් නොයොදවා ණයවර ලිපි මගින් භාණ්ඩ ගෙන්වීමට ආයතනකරුවන්ට වාණිජ බැංකු පහසුකම් සපයයි. ඒ අනුව එසේ ණයවර ලිපි භාවිතයේ දී වාණිජ බැංකුව වෙත කිසියම් ආන්තිකයක් තැන්පත් කළ යුතුය. එකී තැන්පත් ප්‍රමාණය පාලනය කිරීමේ අයිතිය මුදල් මණ්ඩලය සතු වේ. ඒ අනුව විවිධ භාණ්ඩ වෙත විවිධ අණපනත් නියම කරමින් ගුණාත්මක පාලනයක යෙදිය හැක. 1960 දී මෙම උපකරණය මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදි. සමපේක්ෂණ අරමුණු සඳහා වාණිජ බැංකු ණය බහුලව ලබාගන්නා ඇමරිකාව වැනි රටවල මෙම උපකරණය මහ බැංකුව විසින් නිතර ක්‍රියාත්මක කෙරේ.

(ඇ) බැංකු පොලී අනුපාතිකයන් නියම කිරීම.

අනුමැතිය ලත් තැන්පතු සඳහා වාණිජ බැංකු විසින් ගෙවන්නා වූ පොලී අනුපාතිකයන් කෙරෙහි බලපෑම් කිරීමට මහ බැංකුවට හැකියාව ඇත. ඒ අනුව උපරිම පොලී අනුපාතයන් නියම කිරීම සිදු කෙරේ. ඊට අමතරව විවිධ වර්ගයේ ණය සඳහා ද අය කල යුතු පොලී අනුපාත කෙරෙහි බලපෑම් කිරීමක් මහ බැංකුව සිදු කරයි. මෙම ගුණාත්මක ණය පාලන ක්‍රමය මගින් වාණිජ බැංකු අන්තිකාරම් කෙරෙහි ප්‍රමාණවත් බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් මහ බැංකුව සතු වේ.

(ඈ) ශිෂ්ට ප්‍රයෝග

මහ බැංකුව රටේ මූල්‍ය අංශයට බලපෑම් කිරීමේ ඇති හැකියාව හේතුවෙන් ආර්ථිකයේ ඇතැම් අංශවලට මුදල් ගලායාම වැලැක්වීමට එකී අංශවලට ණය නොදෙන ලෙස වාණිජ බැංකු වලින් ඉල්ලා සිටීමේ හැකියාව මහ බැංකුව සතු වේ. එකී අයිතිය ශිෂ්ට ප්‍රයෝග ලෙස හඳුන්වයි. මේවා නියෝග හෝ ව්‍යවස්ථාපිත බලතල ලෙස භාවිතා නොකෙරේ. එංගලන්ත මහ බැංකුව විසින් මුදල් සැපයුම පාලනය කිරීම උදෙසා වැඩි වශයෙන් උපයෝගී කරගන්නේ ශිෂ්ට ප්‍රයෝග නොහොත් කාරුණික ඉල්ලීමයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොටස් මිලදී ගැනීම,

භාණ්ඩ රැස් කිරීම වැනි අත්‍යවශ්‍ය නොවන අංශවලට ණය නිකුත් කිරීම වැලැක්වීමට ශිෂ්ට ප්‍රයෝග යොදා ගනු ලැබේ.

**මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්**

මහ බැංකුව විසින් විවිධාකාරයේ වූ කාර්යයන් ඉටු කරනු ලබයි. මෙහිදී ඒවායින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් හඳුන්වාදෙනු ලැබේ.

01. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

මහ බැංකුව විසින් තම අරමුණු ඉටු කරගැනීම සඳහා ආර්ථිකයේ මුදල් සැපයුම හා පොලී අනුපාතික කෙරෙහි බලපෑම් ඇති කිරීම මූල්‍ය ප්‍රතිපත්ති ලෙස සරල ව දැක්විය හැකිය. මෙහි මූලික අරමුණ වන්නේ රටේ මුදල් සැපයුම දේශීය ආර්ථිකයට ගැලපෙන පරිදි හැසිරවීම යි. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව වෙත නීතිමය බලතල පිරිනමා ඇති අතර මූල්‍ය තත්ත්වය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය මණ්ඩලයට අවශ්‍ය නිර්දේශ හා වාර්තා උදෙසා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවක් පිහිටා ඇති අතර ඒවා සෑම මසකට වරක් ම මූල්‍ය ක්‍රමයේ එහි දුර්වලතාවයන් පිලිබඳ ව සවිස්තරාත්මක වාර්තාවක් මූල්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

02. විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම.

2001 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ පාලන විනිමය අනුපාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් සමඟ ඉල්ලුම්, සැපයුම් බලවේග පදනම් කර ගනිමින් විනිමය අනුපාතිකය තීරණය වේ. මේ හේතුවෙන් විනිමය අනුපාතිකයේ ඇති වන අයථා උච්චාවචනයන් වැලැක්වීමට ත්, විදේශ විනිමය සංචිත සතුටුදායක මට්ටමක පවත්වාගෙන යාමටත් මහ බැංකුව සෘජුව මැදිහත් වේ. මේ සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොලේ මිල ගණන්වලට හෝ ඊට ආසන්න මිලකට හෝ විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම සිදු කරයි.

03. මිල විදේශ සංචිත කළමනාකරණය

මහ බැංකුව විසින් රටේ මිල ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීම සිදු කිරනු ලබයි. ජාත්‍යන්තර ලෙස රුපියලේ ස්ථායිතාව රැකගැනීමට ත්, ජාත්‍යන්තර ගණුදෙනු නිදහසේ සිදු කරගෙන යාම උදෙසා ත් ප්‍රමාණවත් ද්‍රවශීල විදේශ ව්‍යවහාර මුදල් සංචිත ප්‍රමාණයක් හා කුඩා ප්‍රමාණයක රත්‍රන් සංචිතයක් තබාගත යුතුයැයි මුදල් නීති පනත මගින් නිර්දේශ කර ඇත. ජාත්‍යන්තර සංචිතවලින් වැඩි කොටසක් විදේශ රාජ්‍ය සුරැකුම්පත්වලත් ඉතිරිය විදේශ ස්ථායි තැන්පතු, ඒක්ෂණ මුදල්, සිංගල් ගිණුම් හා රත්‍රන්වලින් පවත්වා ගැනේ. ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලර් ස්ටාර්ලින් පවුම් හා යුරෝ මුදල්වලින් ජාත්‍යන්තර සංචිත පවත්වාගනු ලබයි.

මේ ආකාරයට ව්‍යවහාර මුදල්වල ආදායම ගණනය කිරීමේ හැකියාව පදනම් කොටගෙන විදේශ ව්‍යවහාර මුදල්වල සංයුතිය තීරණය කෙරේ.

04. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.

මහ බැංකු වෙත මුදල් නීති පනතේ 49 වන ඡේදය යටතේ මෙරට මුදල් නිකුත් කිරීමේ පරම බලය හිමි වේ. ඒ අනුව මහ බැංකුව විසින් කාසි හා නෝට්ටු විවිධ වටිනාකම්, විවිධ හැඩවලින් යුක්තව නිකුත් කරනු ලැබේ. එය මහ බැංකුවේ වගකීමක් ලෙස සලකයි. මහ බැංකුවට මුදල් නිකුත් කිරීමට උපරිම සීමාවක් නියමකොට ඇත. මහජනතාව විසින් කාසි හා නෝට්ටු පිලිගැනීම ප්‍රතික්ෂේප කළහොත් එම වටිනාකම මහජනතාවට ගෙවීමට විකල්ප ක්‍රම මොවුන් ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා මහ බැංකුව විසින් මුදල් මාරු කොට දීමේ කවුළු පවත්වාගෙන යනු ලැබේ. සාමාන්‍ය මහ ජනතාවට අවශ්‍ය නම් තමන් සතු මුදල් නෝට්ටු වෙනුවට අලුත් මුදල් නෝට්ටු මහ බැංකුවෙන් හුවමාරු කරගත හැක.

05. රජයේ බැංකුකරු ලෙස හා වාණිජ බැංකුවල බැංකුකරු වීම.

රජයේ දෙපාර්තමේන්තු, නියෝජ්‍ය ආයතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යාම, නිශ්කාශන පහසුකම්, ණය සැපයීම ආදී කාර්යයන් මහ බැංකුව විසින් ඉටු කරයි. රජය වෙනුවෙන් ණය නිකුත් කිරීම, ණය සේවා කළමනාකරණය ආදී වගකීම් මහා බැංකුව වෙත පැවරේ. මීට අමතරව රජයට අවශ්‍ය මූල්‍ය උපදෙස් හා නිර්දේශ නිකුත් කිරීම සිදු කරයි. මීට අමතරව සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 15 දින හෝ ඊට පෙර මුදල් ඇමතිතුමා වෙත අයවැය කතාව පිළියෙළ කිරීම පිණිස රහස්‍ය වාර්තාවක් මහ බැංකුව මඟින් ඉදිරිපත් කෙරේ.

මහ බැංකුව වාණිජ බැංකුවල බැංකුකරුවෙක් ලෙස ද හැඳින්වේ. වාණිජ බැංකු සමඟ සමීප සම්බන්ධතාවයකින් යුක්තව ඒවායේ කටයුතු සිදුකරනු ලබයි. ඒ අනුව බැංකුවල ගිණුම් පවත්වාගෙන යාම, බැංකු අධීක්ෂණය, අන්තර්බැංකු ගණුදෙනු නිශ්කාශනය, කෙටිකාලීන ණය සැපයීම සිදු කෙරේ. මහ බැංකුව විසින් සපයන ණය ප්‍රධාන කොටස් 3 කි.

- ❖ වාණිජ ණය
- ❖ නිෂ්පාදන ණය
- ❖ අත්තිකාරම් ණය

යනුවෙනි. මීට අමතරව කොටස් මිලදී ගැනීමේ කටයුතුවල නිරත වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ප්‍රවණතා**

1950 සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු දිනෙන් දින පුළුල් වෙමින් පවතියි. ශ්‍රී ලංකාවේ සෞභාග්‍යමත්භාවය උදෙසා කටයුතු කිරීමට මහ බැංකුව සැමවිටම කටයුතු කරනු ලැබේ. එමඟින් ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් සංවර්ධනයේ ප්‍රතිලාභ සෑම දෙනාටම අත්පත් කරගැනීමට ත් කටයුතු සලස්වනු ලැබේ.

1950 දී ජෝන් එක්ස්ටර් මහතාගේ අධිපතිත්වයෙන් යුතුව ආරම්භ කරන ලද මහ බැංකුවේ කටයුතු නූතනය වන විට ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ අධිපතිත්වය

යටතේ පවතියි. එදා සිට මේ දක්වා විවිධ ක්‍රියාත්මකවීම් හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ මූල්‍ය ක්‍රමය වෙත විවිධ බලපෑම් කිරීම් කරනු ලැබේ.

රටේ සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ අවබෝධ වීම තුළ 1974 වර්ෂයේ දී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව පිහුටුවීමත් සමඟ සංවර්ධන ප්‍රතිපත්ති නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව දායක විය.

1981 දී ග්‍රාමීය අංශය වර්ධනය කිරීමේ අරමුණින් ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මහ බැංකුව විසින් පෞද්ගලික අංශය භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කෙරෙහි උනන්දු කරවීමේ අදහසින් 1981 අප්‍රේල් මාසයේ දී භාණ්ඩාගාර බිල්පත් සඳහා ද්විතීයික වෙළපොලක් හඳුන්වා දෙන ලදි. මෙකල විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහා අක්වෙරළ බැංකු පහසුකම් ලබාදීම සිදු කරන ලදි. 1960 - 1970 කාලය තුළ වාණිජ බැංකු ශාඛා පද්ධතියේ සිදු වූ ප්‍රසාරණය හේතුවෙන් මහ බැංකුව වෙත විශාල කාර්යභාරයක් එල්ල විය. ඒ අනුව 1981 මාතර ප්‍රදේශයේ දී ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ත් 1982 අනුරාධපුරයේ දී අනුරාධපුර, පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ත් 1985 මාතලේ දී නුවර, මාතලේ හා නුවර එළිය දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ත් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවන ලදි. මෙතෙක් කොළඹ මූලස්ථානයෙන් සිදු කරන ලද සියලුම කාර්යයන් මෙකී ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කිරීම සිදුවිය. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන ණය දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය තොරතුරු රැස් කිරීම, දැනුවත්භාවය වර්ධනය කිරීම, ආර්ථික හා මූල්‍ය දත්ත ලබාදීම ආදිය සිදු විය. මේ වනවිට මෙම කාර්යාල 30ට අමතරව යාපනය හා ත්‍රිකුණාමලයෙහි ද ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඓතිහාසික පසුබිම විදහාපෑම සඳහා 1982 අප්‍රේල් මස 20 දින මුදල් කෞතුකාගාරයක් මහ බැංකු පරිශ්‍රයේදී පිහිටුවන ලදි. පසුව මෙය රාජගිරියේ පිහිටි මහ බැංකුවේ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය වෙත ගෙන යන ලදි.

ශ්‍රී ලංකාවේ ඒ වනවිට අපනයන ක්ෂේත්‍රයේ ව්‍යාපෘති කටයුතුවල නියැදෙන්නට වූ බැවින් 1983 දී ණය උපදේශක ඒකකයක් පිහිටුවන ලදි. ග්‍රාමීය ආර්ථිකය තුළ සිදුකළ යුතු වර්ධනීය තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස 1985 දී ප්‍රථම ග්‍රාමීය බැංකුව බුලත්සිංහල දී ස්ථාපිත විය. ඊට අමතරව 1988-03-01 චෙක්පත් සඳහා ශ්‍රී ලංකා ස්වයං නිශ්කාශන ව්‍යාපෘතිය අරඹන ලදි. වෙළඳපොළ අර්ථ ක්‍රමය ස්ථාපිත වීමත් සමඟ මූල්‍ය ආයතනවල ඇති වූ විශාල වර්ධනය තුළ එම ආයතනවල ස්ථායිතාව ඇති කිරීමට 1988 අංක 78 දරණ සංශෝධන පනත මගින් මහ බැංකුව සතු බලතල වැඩි විය. ඒ අනුව 1988 දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි.1990 දෙසැම්බර් 21 දින මුදල් හා බැංකු ක්‍රම පිළිබඳ ස්ථානාධිපති කොමිසම පිහිට වූ අතර එමගින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වය තවදුරටත් සනාථ කරන්නට විය. මීට අමතරව 1990 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රත්‍රන් අලෙවිහල් 2 ක් කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපල ප්‍රදේශයේ පිහිටුවන ලදි. 1992 නොවැම්බර් සිට ආනයනය සඳහා සියලුම බැංකුවලට අවසර දීම සිදු විය. ලාංකීය මූල්‍ය ඉතිහාසය

ඉතා සුවිශේෂී සිදුවීම් ලෙස 1993 දී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රතිමිල ගිවිසුම් ක්‍රමය හඳුන්වා දීමත් 1995 දී ප්‍රතිවිකුණුම් ක්‍රමය හඳුන්වා දීමත් සමඟ මෙම වෙළඳපොළ කටයුතු වඩාත් සාර්ථක මඟකට යොමු විය.

2002 වර්ෂය තුළදී මුදල් නීති පනත සංශෝධනය කිරීම මගින් බහු විධ අරමුණු වෙනුවට ප්‍රධාන අරමුණු 2 ක් මහ බැංකු මඟින් ස්ථාපිත කරන ලදි. ඒ අනුව,

- ආර්ථික හා මිල ස්ථායිතාවය
- මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය

මීට අමතරව 2004 දී නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් ක්‍රමය, මධ්‍යම දත්ත ක්‍රමය, තත්කාලීන දළ පියවුම් ක්‍රමය ආදී තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම තුළ මහජනතාවට පහසුවෙන් මූල්‍ය කටයුතුවල නිරතවීමට හැකි විය.2006 දී සිදු වූ නවතම ණය උපකරණයක් ලෙස ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර හඳුන්වාදීමත් සමඟ ආර්ථිකය තුළ මහ බැංකු ක්‍රියාකාරිත්වය තවත් පුළුල් විය.2008 වර්ෂය තුළ ද ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු හා මූල්‍ය සමාගම් වෙනුවෙන් තවතවත් වැදගත් කාර්යයන් හඳුන්වා දෙන ලදි.2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් Trera - D විදේශ මුදල් සම්ප්‍රේෂණ ක්‍රමය හඳුන්වාදීමත් සමඟ මෙරට දියුණුවට හා සංවර්ධනයට තව තවත් පිටුවහලක් ලැබිණි.

කෙසේ වෙතත් 1950 සිට ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ මට්ටම විවිධ වෙනස්වීම් හමුවේ පවතින විට ලාංකීය මූල්‍ය ක්ෂේත්‍රය තුළ ස්ථාවරතාවය රඳාපවත්වා ගැනීමට මේ දක්වා මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය ඉතාමත් අගනේ ය.

නූතනය වන විට ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා විවිධ දෙපාර්තමේන්තු, ශාඛා පිහිටුවා ඇති අතර එමගින් ආර්ථික කටයුතු විධිමත්ව ඉටු කෙරේ. ඒ අනුව මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නිල විදේශ සංචිත කළමනාකරණය ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම, බැංකු මූල්‍ය සමාගම් හා ප්‍රාථමික නියෝජිතයන් අධීක්ෂණය කිරීම හා ඒ සඳහා බලපත්‍ර ලබාදීම, අධීක්ෂණ හා නියාමන කටයුතු සිදු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පියවීමේ ගිණුම් පවත්වාගෙන යමින් මූල්‍ය ආයතන පියවීම් පහසුකම් හා නිශ්කාශන පියවා ගැනීම්වලට සහාය වීම, සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය ආදී කාර්යයන් රැසක් ඉටු කරයි.ඒ සඳහා දෙපාර්තමේන්තු 27 තුළ ඉතා වැදගත් මෙහෙයවීමක් පවතිනු ලැබේ. එහිදී මහ බැංකුව හරහා ආර්ථිකයට සිදු කරන කාර්යභාරය ඉහළ මට්ටමක පැවතිණි. ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය ආයතනය ලෙස විශේෂ සේවාවක් ඉටු කරනු ලැබේ. මේ ආකාරයට මහ බැංකුව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව සමස්ත මූල්‍ය පද්ධතිය හැසිරවීම උදෙසා සෘජුව බලපාන බව පැහැදිලි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

සමරසිරි පී. (2011), මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය, ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය, කොළඹ 01

නන්දසේන කේ. ඩී. (1993), බැංකු මූලධර්ම හා පරිචය, සී/ස දීපානි මුද්‍රණාලය, නුගේගොඩ.

දිසානායක පී. ආර්. (2009), ශ්‍රී ලංකාවේ බැංකු සහ සේවා, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, කොළඹ 10. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2015)

www.cbsl.gov.lk